**ව්‍යාපෘති යෝජනා සඳහා ආරාධනා**

**" ත්‍රෛලෝක විජයපත්‍ර" මත පදනම් වූ ඖෂධීය නිෂ්පාදන අපනයනය සඳහා ආයෝජන අවස්ථා**

අපනයන අරමුණු සඳහා "ත්‍රෛලෝක විජයපත්‍ර" මත පදනම් වූ ඖෂධ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන සඳහා ලෝකයේ ඇති ඉල්ලුම සැලකිල්ලට ගෙන, "ත්‍රෛලෝක විජයපත්‍ර" වගා කිරීම සහ නිෂ්පාදනය කිරීම සඳහා උනන්දුවක් දක්වන දේශීය හා විදේශීය ආයෝජකයින්ගෙන් ව්‍යාපෘති යෝජනා කැඳවනු ලැබේ.

මෙම ව්‍යාපෘති ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සහ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ විෂය පථයට අයත් වන අතර එහිදී ආයෝජන මණ්ඩල කලාපයක් තුළ අදාල ව්‍යාපෘති සඳහා පහසුකම් සැලසීම සහ ක්‍රියාත්මක කිරීම සිදු කරන අතර ආයුර්වේද දෙපාර්තමේන්තුව, වගාව සහ නිෂ්පාදන කටයුතු අධීක්ෂණය, සම්පූර්ණ ක්‍රියාවලිය නියාමනය කිරීම සහ ව්‍යාපෘති සඳහා බලපත්‍ර නිකුත් කිරීම සිදු කරයි.

අදාල ව්‍යාපෘති යෝජනා 1961 අංක 31 දරන ආයුර්වේද පනත, 1978 අංක 04 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නීතිය සහ අදාළ අනුබද්ධ නීතිවලට අනුකූලව ඇගයීමට ලක් කෙරේ.

**අ) අයදුම් කිරීම සඳහා උපදෙස්**

1. ඉල්ලුම්පත්‍ර, කොළඹ 1, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, බටහිර කුළුණ, 24 වන මහලෙහි පිහිටි, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ආයෝජන ඇගයීම් දෙපාර්තමේන්තුවෙන් හෝ ආයෝජන මණ්ඩලීය වෙබ් අඩවිය (www.investsrilanka.com) හරහා 2024 ජුනි මස 12 දින සිට 26 දින දක්වා කාලය තුළ ලබා ගත/ බාගත කළ හැක.

2. අපේක්ෂිත අයදුම්කරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් විසින් නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත, ආයෝජන ව්‍යාපෘති යෝජනාවේ පිටපත් දෙකක් සමඟ කොළඹ 1, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, බටහිර කුළුණ, 24 වන මහලෙහි පිහිටි, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ආයෝජන ඇගයීම් දෙපාර්තමේන්තුව වෙත 2024 ජූලි මස 10 වන දින පස්වරු 1.00 ට හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතුය.

3. ව්‍යාපෘතියේ මූල්‍ය ශක්‍යතා සහ තාක්ෂණික හා ප්‍රායෝගික ශක්‍යතාව තක්සේරු කිරීමට අවශ්‍ය තොරතුරු ආයෝජන යෝජනාවලට ඇතුළත් විය යුතු අතර එවැනි තොරතුරු ලබා දීමට නොහැකි වීම නුසුදුසු අයදුම්කරුවකු වීමට හේතු වේ.

4. අයදුම්පත් භාරදෙන අවස්ථාවේදී, අයදුම්කරුවන් පහත සඳහන් (ආපසු නොගෙවන) ගාස්තු ගෙවිය යුතුය:

   (i) ආයෝජන මණ්ඩලය වෙත ඇමරිකානු ඩොලර් 400 ක (ඇමරිකානු ඩොලර් හාරසියයක්) අයදුම්පත්‍ර ගාස්තුව

   (ii) ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත ඇමරිකානු ඩොලර් 1250 ක (ඇමරිකානු ඩොලර් එක්දහස් දෙසිය පනහක්) ව්‍යාපෘති ඇගයීමේ ගාස්තුව

**ආ) සුදුසුකම් ලත් අයදුම්පත් සඳහා නියම සහ කොන්දේසි**

ව්‍යාපෘති යෝජනා ඇගයීමෙන් පසුව, සුදුසුකම් ලත් අයදුම්කරුවන් පහත සඳහන් දෑ සැපිරිය යුතුය.

1. ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම අත්සන් කිරීමට පෙර, ඇමරිකානු ඩොලර් මිලියන 2 ක ආරක්ෂක තැන්පතුවක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත තැබීම. මෙය බලපත්‍රයේ වලංගු කාලය පුරාවට පැවතිය යුතුය.
2. අවශ්‍ය නිර්ණායක සපුරාලීම මත සහ ආයෝජන මණ්ඩලයේ නිර්දේශය මත සුදුසුකම් ලත් ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රය නිකුත් කරනු ඇත.

   ඇමරිකානු ඩොලර් 100,000ක (ඇමරිකානු ඩොලර් ලක්ෂයක) බලපත්‍ර ගාස්තුවක් ව්‍යාපෘතිය වෙනුවෙන්, ශ්‍රී ලංකා ආයුර්වේද දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු අතර, ඉන් පසුව වාර්ෂිකව ඇමරිකානු ඩොලර් 200ක (ඇමරිකානු ඩොලර් දෙසීයක) බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තුවක් ගෙවිය යුතුය.

3. ඇමරිකානු ඩොලර් 500,000 ක (ඇමරිකානු ඩොලර් ලක්ෂ පහක්) අවම ව්‍යාපෘති ආයෝජනයක් සිදුකල යුතුය.

වැඩිදුර තොරතුරු කොළඹ 1, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, බටහිර කුළුණ, 24 වන මහලෙහි පිහිටි, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ආයෝජන ඇගයීම් දෙපාර්තමේන්තුවේ අංශ නිලධාරි මගින් ලබා ගත හැක.

(දුරකථන අංකය: 0094 11 2386 953/ 0094 11 2427 342).

ලේකම්
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය

ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය

12-06-2024